**සිරකරු සුභසාධක අරමුදල - 2018**
**-----------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

සිරකරු සුභසාධක අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ප්‍රමිත අංක 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු ගිණුම් කටයුතු සම්බන්ධ හෙළිදරව් කිරීම් යටතේ අරමුදල සඳහා රැස්කරනු ලබන ආදායම් ශීර්ෂයන්හි ලැබීම්වල අවිනිශ්චිතතාවය, අරමුදලේ කටයුතු සඳහා රජයේ දායකත්වයක් නොමැති වීම, සමාලෝචිත වර්ෂය සඳහා වැය දැරීමට ප්‍රමාණවත් අරමුදල් නොතිබීම , සමාලෝචිත වර්ෂය සඳහා අයවැය සකස් කර නොතිබීම වශයෙන් දක්වා තිබීම හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව අනාවරණය කර ගත නොහැකි විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. අරමුදලේ ආදායම් මාර්ග අවිනිශ්චිත තත්ත්වයක පැවතීම, රජයේ දායකත්වයක් නොමැති වීම වැනි කරුණු මත අරමුදලේ ශේෂය ප්‍රමාණවත් නොවීම නිසා සමාලෝචිත වර්ෂයේ වැය දැරීමට ප්‍රමාණවත් අරමුදල් නොතිබීමෙන් ඇති වූ තත්ත්වය මත සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් සකස් නොකරන ලද නමුත් අරමුදලේ පරමාර්ථයන් යම්තාක් දුරකට හෝ ඉටු කර ගැනීම සඳහා බාහිර ආයතන හා ස්වේච්ඡා සංවිධාන වල අනුග්‍රහයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව අවධානය යොමු කළ යුතුවේ. |
| (ii) | ප්‍රමිත අංක 07 හි 25 ඡේදය ප්‍රකාරව මුදල් හුවමාරු නොවන ගනුදෙනුවක් හරහා වත්කම් අත්පත් කර ගෙන ඇති විට, එහි පිරිවැය එම වත්කම අත්පත්කර ගත් දිනට පැවති සාධාරණ වටිනාකමට අගය කල යුතුයි. එසේ වුවද, බන්ධනාගාර ආයතන 02 ක පරිත්‍යාග වත්කම් අයිතම 33 ක සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි. | එම වත්කම් සඳහා තක්සේරු මණ්ඩලයක් පත්කර වෙළඳපළ සමීක්ෂණ මගින් වටිනාකම් නිර්ණය කර 2019 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව දැනුම් දෙමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව කටයුතු කළ යුතුවේ. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිත්‍යාග ලෙස ලැබෙන වත්කම්වල වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට පරිත්‍යාග වත්කම්වල ධාරණ අගය රු.9,076,568 ක් වුවද, එදිනට පරිත්‍යාග වත්කම් සංචිත ගිණුමේ ශේෂය රු.21,920,102 ක් වශයෙන් දක්වා තිබුණි. | පරිත්‍යාග වත්කම් ලෙස ලැබෙන වත්කම් වල වටිනාකම හඳුනාගෙන එම වත්කම් වල අගය ප්‍රාග්ධනිත කිරීමට නොමිලේ වත්කම් ප්‍රදානයන් සංචිත ගිණුමට බැර කර ඇත. ඒ අනුව 2018.12.31 දිනට එම ගිණුමේ ශේෂය රු.21,920,102 කි. මෙම ප්‍රාග්ධනිත කරන ලද පරිත්‍යාග වත්කම් භාවිතයේදී, වාර්ෂික ක්ෂයවීම් ඒ ඒ වර්ෂයේ ආදායම් වියදම් ගිණුමෙන් කපාහැර ඇත. එම හේතුවෙන් ක්ෂයවීම් වලට සමාන අගයකින් සිරකරු සුභසාධක අරමුදලේ පරිත්‍යාග වත්කම් වල ධාරණ අගය, ක්ෂයවීම් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර ඇත. | හඳුනාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව පරිත්‍යාග වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බෝගම්බර බන්ධනාගාරය, දුම්බර බන්ධනාගාරය හා කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ අස්ථානගත වූ පරිත්‍යාග වටිනාකම පිළිවෙලින් රු.181,365 ක් හා රු.46,500 ක් වූ වත්කම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී භෞතික වශයෙන් නොපවතින භාණ්ඩ විධිමත් පරිදි පොත් වලින් ඉවත් කර ගැනීමට අවශ්‍ය උපදෙස් බන්ධනාගාර අධිකාරිවරුන්ට ලබා දීමට සටහන් කර ගත් බවත් ඉදිරියේදී විධිමත් කමිටුවක් පත් කර එමඟින් මෙම වත්කම් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බවත් දැනුම් දෙමි. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුවේ. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී බන්ධනාගාර ආයතන සඳහා ලද පරිත්‍යාග වත්කම් වටිනාකම රු.2,158,133 ක් වශයෙන් දක්වා තිබුණි. එසේ වුවද, නියැදි පරීක්ෂණයට අනුව ආයතන 11 ක තහවුරු කළ පරිත්‍යාග වත්කම් වටිනාකම් අතර රු.520,030 ක වෙනසක් හා ආයතන 03 ක් විසින් වටිනාකම රු.70,900 ක පරිත්‍යාග වත්කම් තහවුරු කර නොතිබුණි. තවද, ආයතන 02 ක් විසින් තහවුරු කළ පරිත්‍යාග වත්කම් වටිනාකම රු.255,275 ක මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | පරිත්‍යාග වත්කම් වාර්තා කිරීමේදී නිසි පරිදි ආකෘතීන් වටිනාකම් සහිතව සම්පූර්ණ කර එවීමට බන්ධනාගාර අධිකාරිවරුවන්ට උපදෙස් දීමට සටහන් කර ගත් බව දැනුම් දෙමි. | සියලු පරිත්‍යාග වත්කම් ගිණුම්වලින් හෙළිදරව් විය යුතුවේ. |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| පරිත්‍යාග වත්කම් ක්ෂය | 2,220,016 | පරිත්‍යාග වත්කම්වලට අදාල උපලේඛනයක් | විගණනය විසින් දක්වා ඇති පරිත්‍යාග වත්කම් ක්ෂය ලේඛණයේ 1997 දෙසැම්බර් 31 දිනට ශේෂය ලෙස පමණක් සඳහන් කළ රු.2,220,016 ක පරිත්‍යාග වත්කම් ශේෂයන් ලෙජරය තුළ ඉදිරියට ගෙනා ශේෂයක් ලෙස පැවති බැවින් එය එලෙසම පවත්වාගෙන යනු ලබයි. | පරිත්‍යාග වත්කම් ලේඛන ගත විය යුතුවේ. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1979 අංක 54 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභසාධක අරමුදල් සංශෝධන පනත - (අආ) වගන්තිය | පොදු තැන්පත් ගිණුමේ හා ආයතනයේ සේප්පු තුළ තැන්පත් කර තිබූ වර්ෂයකට නොඅඩු කාලයක් තුළ හිමිකම් නොපෑ වේතන හා පෞද්ගලික මුදල් රු.312,785 ක් අරමුදලට බැර කර නොතිබුණි. | අදාළ ආයතන වලින් හිමිකම් නොපෑ මුදල් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ වාර්තාවක් කැඳවා ඒවා සිරකරු සුභසාධක අරමුදලට බැර කිරීමට බන්ධනාගාර අධිකාරිවරුන්ට අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කරමි. | සිරකරු ශුභසාධක අරමුදල් පනතේ විධිවිධාන අනුගමනය කළ යුතුවේ. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 104 | වැලිකඩ, මැගසින්, අනුරාධපුරය යනාදි බන්ධනාගාර ආයතනවල අභ්‍යන්තර කැරලි වලින් හානියට පත්වූ පරිත්‍යාග වත්කම් හා ගාල්ල බන්ධනාගාරයේ 2014 දෙසැම්බර් 26 සුනාමි ව්‍යසනයෙන් විනාශ වූ භාණ්ඩ සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ලිපි ලේඛනවල අඩුපාඩු ඇති බැවින් නිවැරදි කර එවන ලෙස උප ආයතනයන් වෙත සිහිකැඳවීම් යවා ඇති අතර මැගසින් බන්ධනාගාර සිද්ධිය පිළිබඳව පොත්වලින් කපාහැරීමේ අයදුම්පත රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වෙත යවා ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.281,121 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,783,683 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,064,804 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ ආදායම රු.391,370 කින් වැඩිවීම හා ඉකුත් වර්ෂයේ සුභසාධක වියදම් වෙනුවෙන් රු.2,853,749 ක් දරා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා කිසිදු වියදමක් දරා නොතිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 1973 අංක 18 දරන සිරකරු සුභසාධක අරමුදල් පනතේ 5 වන වගන්තියට අනුව සිරකරු සුභසාධක අරමුදලේ කාර්යයභාරය ඉටු කිරීම සඳහා සිරකරුවන් වෙනුවෙන් සුභසාධන වැඩසටහන් කිසිවක් සමාලෝචිත වර්ෂයේ දී පවත්වා නොතිබුණි. එම හේතුවෙන් 2018 ජනවාරි 01 දිනට පැවති අරමුදලේ භාණ්ඩාගාර ශේෂය රු.921,313 ක් හා සමාලෝචිත වර්ෂය තුළ දී ලැබී තිබුණු රු.1,915,620 ක ආදායම උපයෝජනය කර ගෙන නොතිබුණි. | 2018.01.01 දිනට පැවති රු.921,313 ක ශේෂය සියළු බන්ධනාගාර ආයතන වල සුබසාධන වැඩසටහන් සඳහා යොදා ගැනීමට ප්‍රමාණවත් නොවූ අතර එය ප්‍රමාණවත් ශේෂයක් බවට පත්වීමට 2018 වර්ෂයේ අවසානය පමණ වූ බැවින් අරමුදලේ ශේෂය වැඩසටහන් සඳහා උපයෝජනය කර නොගන්නා ලද නමුත් සිරකරුවන් වෙනුවෙන් සිදු කරනු ලබන සුබසාධන කාර්යයන් ස්වේච්ඡා ආයතන, සිරකරු සුභසාධක උප සංගම්, බාහිර ආයතන හා පුද්ගලයන්ගේ දායකත්වය මත සිදු කරන ලදී. | තිබෙන අරමුදල් ප්‍රශස්තව උපයෝජනය කළ යුතුවේ. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ආදායම රු.1,915,620 ක් වූ අතර ආදායම වැඩිකර ගැනීම සඳහා පනත ප්‍රකාරව ප්‍රතිපාදන සලසා ඇති ආදායම් ශීර්ෂ 10 යටතේ ආදායම් එකතු කර ගැනීමට ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම කෙරෙහි නිසි අවධානයක් යොමු කර නොතිබුණි. | -එම- | තිබෙන අරමුදල් ප්‍රශස්තව උපයෝජනය කළ යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් පරිදි අරමුදලෙහි අරමුණුවලට අනුකූලව භාණ්ඩාගාරය විසින් හඳුන්වා දී ඇති ආකෘති පත්‍රවලට අනුව පිළියෙල කරන ලද වාර්ෂික අයවැය ලේඛනය අදාළ අනුමැතීන් සහිතව සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළයුතු වුවද 2018 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | 2017 වර්ෂය අවසාන වන විට පැවති අරමුදලේ ශේෂය 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් සකස් කිරීමට තරම් ප්‍රමාණවත් නොවූ බැවින් ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කිරීමට නොහැකි විය. 2019 වර්ෂය සඳහා නියමිත පරිදි ඇස්තමේන්තුවක් සකස් කර ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. |